## මධ්‍යම සංස්කෘතික අරමුදල - 2014

-----------------------------------

මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9 (4) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

--------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

### 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

-------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 02. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය ව්‍යාචනය

-------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතු කොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

#### 2.2.1 සම්බන්ධිත පාර්ශවයන් සමග ඇති ගනුදෙනු හෙළිදරව් නොකිරීම

--------------------------------------------------------------------------

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති පුද්ගලික සමාගමක් වන සී.ස.සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් සමාගම මධ්‍යම සංස්කෘතික අරමුදලේ ඇතැම් ඉදිකිරීම් හා සංරක්ෂණ කටයුතු කොන්ත්‍රාත් පදනම මත ඉටුකරනු ලබයි. සමාලෝචිත වර්ෂය තුළ මධ්‍යම සංස්කෘතික අරමුදලේ ව්‍යාපෘති වැඩබිම්වල කැණීම් / සංරක්ෂණ සහායකයින් ලෙස කම්කරුවන් මෙම සමාගම මගින් සේවයේ යොදවා ඒ සඳහා රු. මිලියන 142 ක් අරමුදලින් සමාගමට ගෙවා තිබුණි.

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තුළට අරමුදලේ අධ්‍යක්ෂ තනතුර දරන නිලධාරීන් දෙදෙනෙකුද, අරමුදලේ කාර්යය මණ්ඩලයේ ගණකාධිකාරීවරයෙකු සමාගමේ ගණකාධිකාරී ලෙසද, සමාලෝචිත වර්ෂය තුළදී කටයුතු කර තිබුණි. මධ්‍යම සංස්කෘතික අරමුදල හා සංස්කෘතික සංරක්ෂණ ඉදිකිරීම් පුද්ගලික සමාගම අතර පවත්නා මෙම සම්බන්ධතාවයේ ස්වභාවය හා ගනුදෙනු පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

2.2.2 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3

---------------------------------------------

ගිණුම්වල සිදු කරනු ලබන පෙර කාලපරිච්ඡේද දෝෂ ගැලපීම්වලට අදාල වැරදි නිවැරදි කිරීම් පෙර වර්ෂයේ සංසන්දනාත්මක තොරතුරු නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමක් ලෙස වෙනස් කර සටහනක් මගින් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු වුවද රු. 44,290,617 ක් වූ පෙර වර්ෂයේ සංසන්දනාත්මක තොරතුරුවලට කළ ගැලපීම් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයට ගලපා තිබුණ නමුත් ඒ පිළිබඳ තොරතුරු සටහන් මගින් අනාවරණය කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7

---------------------------------------------

(i) සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත් දැනටමත් භාවිතා කරනු ලබන ස්ථාවර වත්කම් සහ භාවිතයට ගත නොහැකි අපහරණය සඳහා ඇති වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු වුවත්, 1982 වර්ෂයේ සිට පැවත එන එකතුව රු. මිලියන 963 ක් වූ දේපල, පිරියත හා උපකරණවල ඇතුළත් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත් භාවිතයට ගනු ලබන වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. තවද 2013 වර්ෂය තුලදී වෙන්දේසි කර තිබුණු සහ ප්‍රයෝජනයට ගත නොහැකිව විනාශ කර තිබුණු භාණ්ඩ වර්ග 758 කට අයත් ඒකක 6,984 ක් හඳුනා ගැනීම අත්හැරී වත්කම් (De recognition ) ලෙස මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබුණි.

(ii) ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කරන විට එක සමාන පන්තියේ ස්ථාවර වත්කම් සියල්ලම ප්‍රත්‍යාගණනය කිරීමට පියවර ගත යුතු වුවත් 2012 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ වාහන 98 කින් වාහන 39 ක් සහ ඉඩම් හා ගොඩනැගිලිවලින් කොටසක් පමණක් රු. 461,115,000 කට ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(iii) දේපල පිරියත හා උපකරණවල අයිතිය සම්බන්ධයෙන් පවතින බාධාවන් හා සීමාවන් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු වුවත් අරමුදලට හිමිකමක් නොමැති මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රධාන කාර්යාලය පිහිටි භූමියේ වටිනාකම රු. 4,064,443 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එහි අයිතියට ඇති සීමාවන් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

2.2.3 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**-------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අඩමාණ ණය වෙන් කිරීම සම්බන්ධයෙන් අරමුදල විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කර නොතිබුණි. ණය අයකර ගැනීමේ හැකියාව පිළිබඳ සමාලෝචනය කිරීමකින් තොරව ඉකුත් වර්ෂ දෙක තුළදී අඩමාණ ණය ලෙස වෙන් කළ මුදලට සමාන මුදලක් එනම් රු. 1,964,833 ක් සමාලෝචිත වර්ෂය සඳහාද අඩමාණ ණය ලෙස වෙන් කර තිබුණි.

(ආ) උරුම වත්කම්, අරමුදලට අයත් නොවන වත්කමක් බවත් එය පුරාවිද්‍යා කොමසාරිස් යටතේ අරමුදල විසින් භාරකාරත්වය දරන බවත් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර තිබුණි. එසේ වුවද උරුම වත්කම් වැඩි දියුණු කිරීම සඳහා දරනු ලබන ප්‍රාග්ධන වියදම් සම්බන්ධ ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී දරන ලද රු. 11,875,792 ක්ද , ඉකුත් වර්ෂයේදී දරන ලද රු. 48,339,812 ක්ද ගොඩනැගිලි, මාර්ග හා යටිතල ව්‍යුහයන් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි.

### 2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය වාර්තා සමග ඉදිරිපත් කර තිබුණු මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට අනුව සමාලෝචිත වර්ෂයේ සමස්ත වියදම් රු. 1,829,809,971 ක් විය. මෙකී වියදමට රු. 66,119,386 ක් උපචිත වියදම්ද ගලපා තිබුණු නමුත්, උපචිත වියදම් ගිණුමට, ඉකුත් වර්ෂයේ උපචිත වියදම් පියවීම් සම්බන්ධව සිදු කර තිබුණු දෝෂ සහිත ගැලපීම් හේතුවෙන් වර්ෂයේ වියදම හා උපචිත වියදම රු. මිලියන 28 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල් රු. 131,910 ක් මුදල් පිටතට ගලායාමක් ලෙසද, කාරක ප්‍රාග්ධනය වෙනස්වීම් ලෙස ගැලපිය යුතු රු. 8,513,943 ක් ආයෝජන ක්‍රියාකාරකම් ලෙසද, ආයෝජන ක්‍රියාකාරකම් ලෙස දැක්විය යුතු රු. 19,115,817 ක් කාරක ප්‍රාග්ධන විචලනයන් ලෙසද, මුදලින් ලැබී නොතිබුණු විදේශාධාර ගැලපීම් රු. 23,921,939 ක් මුදලින් ලද විදේශාධාර ලෙසද, රු. 3,447,027 ක විදේශාධාර ලැබීම් මුදල් පිටතට ගලායාමක් ලෙසද නිවැරදි නොවන ආකාරයට මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගලපා තිබුණි. මේ නිසා මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ප්‍රමිතිය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි.

(ඇ) විදේශ ආධාර ප්‍රදානයන් ලෙස 1984 වර්ෂයේ සිට 2004 වර්ෂය දක්වා කාලය තුළ ලැබී තිබුණු වාහන 21 කින් වාහන 10ක සාධාරණ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි. එම වාහනවල රක්ෂිත වටිනාකම රු. 5,460,000 ක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඈ) සුනාමි කෞතුකාගාරයක් ඉදිකිරීම සඳහා 2005 වර්ෂයේදී රු. 2,558,000 කට මිලදී ගෙන තිබුණු ගාල්ල නුගගහවත්ත ඉඩමෙහි වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ඇතුලත් කර නොතිබුණි.

(ඉ) ප්‍රත්‍යාගණනය කරන ලද ගොඩනැගිලිවලට අදාල 2013 හා 2014 වර්ෂවල ක්ෂය රු. 2,100,000 ක් වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයට හර නොකර විදේශ සම්පත් අරමුදලට හර කර තිබීම හේතුවෙන් විදේශ සම්පත් අරමුදලේ ශේෂය එම වටිනාකමින් අඩුවෙන්ද වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය එම වටිනාකමින් වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂය තුළදී ලබාදී තිබු රු. 1,000,000 ක මුදල ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත නොකර වර්ෂයේ ආදායමට එරෙහිව ලියාහැර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ රක්ෂණ වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල රු. 1,342,446 ක් දක්වා තිබුණද මෝටර් රථ රක්ෂණය වෙනුවෙන් දරන ලද වියදම රු. 2,293,842 ක් විය. සේවක වෛද්‍ය ආධාර රක්ෂණ වන්දි ලැබීම් හා ගෙවීම්ද රක්ෂණ ගිණුම තුළ ඇතුළත් කර තිබීම නිසා මෝටර් රථ වෙනුවෙන් දරන ලද වාර්ෂික රක්ෂණ වියදම ගිණුම්වලින් හෙළිදරව් වී නොතිබුණි.

(ඌ) සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු පිරිවැය රු. 5,067,106 ක් වු විදේශාධාර මත ලැබී තිබුණු වෑන් රථයක් නැවත ප්‍රත්‍යාගණනය කර රු. 4,300,000 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා

තිබුණද එම රථයේ මුල් වටිනාකම හා සමුච්චිත ක්ෂය ප්‍රමාණය ගිණුම්වලින් ඉවත්කර නොතිබීම හේතුවෙන් මෝටර් රථ පිරිවැය හා සමුච්චිත ක්ෂය රු. 5,067,106 කින් වැඩියෙන් දක්වා තිබුණි. එසේම එම වාහනයේ ප්‍රත්‍යාගණිත අගය මත සමාලෝචිත වර්ෂයේදී සිදුකර තිබුණු ක්ෂය රු. 860,000 ක ප්‍රමාණයට අදාල ක්‍රමක්ෂය විදේශ සම්පත් අරමුදල් ගිණුමේ සටහන් කිරීම වෙනුවට ප්‍රත්‍යාගණන සංචිතයට ඇතුලත් කිරීම හේතුවෙන් විදේශ සම්පත් අරමුදල් ගිණුම රු. 860,000 ක් වැඩියෙන්ද, වත්කම් ප්‍රත්‍යාගණන සංචිත ගිණුම එම වටිනාකමින් අඩුවෙන්ද දක්වා තිබුණි.

(එ) පරිත්‍යාග ලෙස ලබාදී තිබූ නිෂ්පාදන පිරිවැය රු. 4,278,305 ක් වූ අනුරුවලට අදාල ශ්‍රමය, පොදුකාර්ය හා නිෂ්පාදන ද්‍රව්‍ය පිරිවැය එම ගිණුම් වලට බැර කිරීම වෙනුවට මුළු පිරිවැය නිෂ්පාදන ද්‍රව්‍ය ගිණුමට බැර කිරීම හේතුවෙන් නිෂ්පාදන ද්‍රව්‍ය ගිණුම රු. 2,032,503 කින් අඩුවී තිබූ අතර ශ්‍රමය රු. 542,242 කින් හා පොදුකාර්ය වියදම් රු. 1,490,261 කින් වැඩි වී තිබුණි.

(ඒ) මෝටර් රථ වැඩිදියුණු කිරීම සඳහා දරන ලද රු. 1,479,575 ක වියදමක් වැරදි සහගත ලෙස සටහන් කිරීම හේතුවෙන් මෝටර් රථ ගිණුම හා උපචිත වියදම් ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) වැය විෂයයන් 02 කට අදාල රු. 2,370,698 ක වියදම් නියමිත පරිදි වර්ගීකරණය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන එක් එක් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එම විෂයයන් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | විශේෂ අරමුදල් ව්‍යාපෘති (ව්‍යාපෘති 10 කට අදාලව) | 8,803,143 | එක් එක් අරමුදලට අදාල තොරතුරු ඇතුළත් ලිපිගොනු හා උපයෝගී ලියවිලි |
| (ආ) | විදේශ අරමුදල් ව්‍යාපෘති (ව්‍යාපෘති 3 කට අදාලව) | 1,969,612 | - එම - |
| (ඇ) | සමුච්චිත ලාභයට හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයට කර තිබුණු ගැලපීම් | 59,331,279 | ගැලපීම් සිදු කල ආකාරය හා ගැලපීම් විස්තර |
| (ඈ) | කහවිල්ගොඩ පුරාණ විහාරයේ ජාතික උරුම උයන භාරය වෙත ගෙවීම් | 30,500,000 | පිරිවැය ඇස්තමේන්තු, ප්‍රමාණ පත්‍ර, ඉදිකිරීම්වලට අදාල ගෙවීම් වවුචර්, රිසිට්පත්, බිල්පත් ආදිය, සැලසුම්, කලවැඩ වාර්තා, ඉංජිනේරු සහතික |
| (ඉ) | ණයගැතියෝ | 950,463 | උපලේඛන හා කාල විශ්ලේෂණ |
| (ඊ) | සෘජුවම කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබූ උඩුගුවනේ රුගත කිරීම් සඳහා ගුවන් ගාස්තු | 2,297,740 | ගුවන් හමුදාව විසින් නිකුත් කළ ඉන්වොයිසියක්, බිල් පතක් හෝ ලදු පතක් |

2.3 **ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ ) 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල් පනතේ 7 වන වගන්තිය අනුව සංස්කෘතික කටයුතු විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල බලයෙන්ම මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රධාන පරිපාලන නිලධාරියා බැවින් එම තනතුර වෙනුවෙන් දීමනා ගෙවීම සඳහා පනත මගින් ප්‍රතිපාදන සලසා නොතිබුණි. එහෙත් අරමුදල විසින් ලේකම්වරයාගේ මාසික වැටුපෙන් සියයට 33 1/3 ක් මාසික දීමනාවක් ලෙස සමාලෝචිත වර්ෂයේදී රු. 241,356 ක් ගෙවා තිබුණි. එමෙන්ම මේ සඳහා ආයතන සංග්‍රහයේ ix පරිච්ඡේදයේ 1.2 වගන්තිය හා 1999 මැයි 04 දිනැති අංක 374 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ආයතන අධ්‍යක්ෂකගේ හා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොතිබුණි.

(ආ) භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමෙන් තොරව විවිධ තැන්පත් ශේෂ 09 ක එකතුව වූ රු. 152,252 ක්ද, අත්තිකාරම් ශේෂ 06 ක එකතුව වූ රු. 166,407 ක් හා මුදල් වංචාවන් 8ක වටිනාකම වූ රු. 1,472,848 ක්ද වශයෙන් එකතුව රු. 1,791,507 ක් බොල්ණය වශයෙන් ගිණුම්වලින් ලියාහැර තිබුණි.

(ඇ) අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් හා අයවැය ඇස්තමේන්තුවකින් තොරව පරිත්‍යාග වශයෙන් රු. 4,618,938 ක්ද, දැයට කිරුළ වියදම් සඳහා රු. 1,299,000 ක්ද සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබුණි.

(ඈ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදයේ විධිවිධානවලට අනුව, ආයතන සතු සම්පත් රේඛීය අමාත්‍යාංශයට හෝ කිසිදු රාජ්‍ය ආයතනයකට ලබා නොදිය යුතු බව දක්වා තිබුණද සමාලෝචිත වර්ෂය තුළදී සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව හා ටවර්හෝල් රඟහල පදනම වෙත රු. 1,000,000 බැගින් රු. 3,000,000 ක් මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් ලබාදී තිබුණි.

2.4 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවකයන් වෙත ගෙවා තිබූ වර්ෂ 6 කට වඩා පැරණි රු. 1,458,653 ක්වූ උත්සව හා විශේෂ අත්තිකාරම් හා ආපදා ණය ශේෂ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනටත් අයනොවී පැවතුණි.

(ආ) වර්ෂ 17 කට වැඩි කාලයක සිට අය නොවී පවතින රු. 153,784 ක්වූ ණයගැති ශේෂ 05 ක් හා වර්ෂ 5 කට වැඩි කාලයක සිට අය නොවී පවතින රු. 75,300 ක ණයගැති ශේෂයක් අයකර ගැනීමට කටයුතු නොකර දිගින් දිගටම ගිණුම්වල දක්වා තිබුණි.

(ඇ) සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයෙන් ලැබිය යුතු වර්ෂ 3 කට වඩා වැඩි කාලයක සිට පැවත එන රු. 772,577 ක් හා වර්ෂ 05 කට වඩා පැරණි රු. 20,598 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ව්‍යාපෘති 02 ක් වෙත ලබාදී වසර 2 ඉක්මවා තිබූ රු. 1,025,420 ක අත්තිකාරම් පියවා නොතිබුණු අතර, සීගිරිය ව්‍යාපෘතිය වෙත ලබාදී තිබූ රු. 343,329 ක අත්තිකාරම් මුදලක්ද වර්ෂ 05 කට වැඩි කාලයක සිට පියවීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) කාර්ය මණ්ඩලය වෙත ලබාදී වසර 2 ඉක්මවා තිබූ රු. 79,924 ක අත්තිකාරම් ශේෂයක් වර්ෂ 5 කට වැඩි කාලයක සිට අය නොවී පවතින අතර වර්ෂ 8 කට වැඩි කාලයක සිට පවතින රු. 44,534 ක උසාවි තැන්පතු ශේෂයක්ද තවදුරටත් අය නොවී පැවතුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් වර්ෂ 05 කට වඩා පැරණි එකතුව රු. 397,019 ක් වූ ගෙවියයුතු ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.5 නීති රීති රෙගුලාසිවලට අනුකූල නොවීම

---

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| (i) XLVII පරිච්ඡේදයේ 1 : 11 වගන්තිය | රාජ්‍ය දේපළ පෞද්ගලික කටයුතු සඳහා යොදවාගත නොහැකි වුවත් මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පෞද්ගලික සංචාරයක් වෙනුවෙන් ගුවන් හමුදා යානයක් යොදාගෙන ඒ සඳහා අරමුදලින් රු. 850,067 ගෙවා තිබූ අතර මේ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය හෝ ලබාගෙන නොතිබුණි. |
| (ii) XLVII පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති | ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ රාජ්‍ය සේවා කොමිෂමේ විධිවිධාන මෙන්ම භාණ්ඩාගාර චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව කටයුතු කරන නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතු වුවත්, යාපහුව ව්‍යාපෘතියේ සංරක්ෂණ කටයුතු සඳහා රු. 1,163,525 ක් වැයකර නීතිවිරෝධි දැව මිලට ගැනීමට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි අංක 396 (ඈ) | නිකුත් කල නමුත්, ගෙවීම සඳහා ඉදිරිපත් කර නොතිබූ මාස 06 ඉක්මවූ එකතුව රු. 110,908 ක් වටිනා චෙක්පත් 07 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි |
| (ii) මුදල් රෙගුලාසි 751 | ලැබෙන සියලුම භාණ්ඩ වහාම බඩු ලේඛන පොතෙහි හෝ ගබඩා ව්‍යවස්ථාවල නියමිත වෙනස් සටහන් පොත්වල ඇතුළත් කළ යුතු වුවත් සීගිරිය ව්‍යාපෘතියේ "මැටිකළය" ප්‍රදර්ශනය සඳහා පැවති උත්සවයේදී මිලදීගෙන තිබුණු රු. 570,455 ක් වටිනා භාණ්ඩ අයිතම 7 ක් බඩුලේඛන පොත්වලට ඇතුළත් කර නොතිබුණි. |
| **(ඇ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | |
| (i) 5.3.13 (අ), 5.4.6 හා 8.12.2 වගන්ති | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමකින් තොරව සීගිරිය කෞතුකාගාරයේ තීන්ත ආලේප කිරීමේ කොන්ත්‍රාත්තුව රු.1,397,000 කට කොන්ත්‍රාත්කරුවකු වෙත පැවරීමේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි. ආපසු ගෙවනු ලබන ඇප තැන්පත් මුදල ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 1 ක් විය යුතු වුවද මෙම කොන්ත්‍රාත්කරුගෙන් ලබා ගෙන තිබූ ඇප තැන්පතුව රු.4,000 ක් විය. තවද, කොන්ත්‍රාත්තුව සඳහා ගෙවීම් කිරීමේදී ඉටුකළ වැඩ වටිනාකමෙන් සියයට 10 කට නොඅඩු මුදලක් අත රැඳවුමක් වශයෙන් රඳවා ගෙන නොතිබූ අතර නියමිත ප්‍රමිතියට අනුව කාර්යය ඉටු කර තිබෙන බවට අධීක්ෂණ නිලධාරියෙකුගේ සහතිකයකින් තොරව ඒ සඳහා ගෙවීම් කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | 4.3.1 , 5.2.1 , 5.3.1 වගන්ති | සීගිරිය ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරුට ප්‍රසම්පාදන කටයුතු කළ හැකි උපරිම සීමාව රු. මිලියන 2 ක් වුවද, ව්‍යාපෘතියේ සනීපාරක්ෂක සේවාව සපයා ගැනීම සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සැකසීමෙන් තොරව ටෙන්ඩර් කැඳවීම හා රු. 3,468,000 කට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම ඔහු විසින් සිදුකර තිබුණි. තවද සියලු වැදගත් තොරතුරු ලංසු ලේඛන තුළ ඇතුළත් කර නොතිබූ අතර ඉදිරිපත් වූ ලංසු සඳහා තාක්ෂණික ඇගැයීම් කමිටුවක නිර්දේශ ලබා ගෙනද නොතිබුණි. |
| (ඈ) | **2011 පෙබරවාරි 11 දිනැති අංක PED/57 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6 ඡේදය** | චක්‍රලේඛය ප්‍රකාරව මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය මත විවිධ බාහිර පාර්ශවයන් වෙත පිරිවැය රු. 5,917,937 ක්වූ අනුරූ නිෂ්පාදන, ප්‍රකාශන තොග සහ මුද්‍රණ ද්‍රව්‍ය පරිත්‍යාග වශයෙන් ලබාදී තිබුණි. |
| (ඉ) | **1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය** | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන ගොස් නොතිබුණි. |

3. **මූල්‍ය සමාලෝචනය**

------------------------

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

---------------

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.479,462,969 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 302,069,090 ක් වුයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 177,393,879 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් වියදම් රු. 313,121,676 කින් වැඩිවී තිබුණද සංචාරක ප්‍රවේශපත් අලෙවි ආදායම ඇතුළු අනිකුත් ආදායම් රු. 490,515,555 කින් වැඩිවී තිබීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

4.1 **කාර්යසාධනය**

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී ඉටු කිරීමට සැලසුම් කර තිබූ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 47.3 ක්වූ කැණීම් හා සංරක්ෂණ වැඩබිම් 28 ක් වර්ෂය තුළදී ආරම්භ කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘති 11 ක් යටතේ කැණීම් හා සංරක්ෂණ වැඩබිම් 24 ක වැඩ ඒකක 19,422 ක් සමාලෝචිත වර්ෂය තුළදී නිම කිරීමට සැලසුම් කර ඒ සඳහා රු. 88,744,470 ක ඇස්තමේන්තුවක්ද සිදුකර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මෙයින් නිම කර තිබුණේ වැඩ ඒකක 2657 ක් පමණි. ඒ සඳහා තථ්‍ය වියදම රු. 6,565,697ක් වූ හෙයින් භෞතික හා මූල්‍ය කාර්යසාධනය පිළිවෙලින් සියයට 14 ක් හා සියයට 7 ක් වැනි ඉතා අඩු මට්ටමක පැවතුණි. තවද සමාලෝචිත වර්ෂයේදී කැණීම් හා සංරක්ෂණ මුළු වැඩබිම් 301 ක වැඩ අවසන් කිරීමට සැලසුම් කර තිබුණද වැඩ අවසන් කර තිබුණේ වැඩබිම් 48 ක පමණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කර තිබූ ඉහත වැඩබිම් 301 සඳහා ඇස්තමේන්තුගත ද්‍රව්‍ය පිරිවැය රු. 210,722,168 ක් හා සෘජු ශ්‍රම පිරිවැය රු. 367,698,199 කින් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ඇස්තමේන්තුගත ද්‍රව්‍ය පිරිවැයෙන් සියයට 24 ක් එනම් රු. 52,177,452 ක් සහ ඇස්තමේන්තුගත සෘජු ශ්‍රම පිරිවැයෙන් සියයට 110 ක් එනම් රු. 402,875,598 ක් තථ්‍ය වශයෙන් වැය කර තිබීම

හේතුවෙන් සමස්ත කාර්යසාධනයේ ශ්‍රමය වෙනුවෙන් දායකත්වය ඉහළ අගයක් ගෙන තිබුණි.

4.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) (i) අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය වන සංචාරක ප්‍රවේශ පත්‍ර මුද්‍රණය, අලෙවිය හා තොග පාලනය සම්බන්ධ විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් සංචාරක ප්‍රවේශ පත් අවභාවිතයේ යෙදවීම සිදු වී තිබුණි. විද්‍යුත් රේඛන (Bar Code System) වැනි නවීන තාක්ෂණ ක්‍රමවේදයක් භාවිතයෙන් මේ පිළිබඳ මනා පාලනයක් ඇති කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2011 දෙසැම්බර් 31 න් පසු අලෙවි කිරීම අත්හිටුවා තිබූ වටරවුම් ප්‍රවේශපත්‍ර 15,968 ක් හා 2012 දෙසැම්බර් 31 දිනෙන් පසු අලෙවි කිරීම අත්හිටුවා තිබූ mini DVD සහිත විදේශීය තනි සංචාරක ප්‍රවේශපත්‍ර 44,904 ක් 2014 ඔක්තෝබර් 31 දිනටත් අවලංගු නොකර ගබඩාවල රඳවාගෙන තිබූ අතර mini DVD සහිත විදේශීය සංචාරක ප්‍රවේශපත්‍ර 2014 වර්ෂයේදීද සංචාරකයන්ට නිකුත් කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

(iii) සංචාරක ප්‍රවේශපත්‍ර මුද්‍රණයේදී දෝෂ සහිත හා අවලංගු කෙරෙන ප්‍රවේශපත්‍ර ආයතනයෙන් බැහැර කරන විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එවැනි ප්‍රවේශපත්‍ර 42,706 ක් පැවති බව භාණ්ඩ සමීක්ෂණ වාර්තා මගින් අනාවරණය කර තිබුණි.

(iv) සීගිරියේ සංචාරක ප්‍රවේශපත්‍ර අලෙවි කිරීම සඳහා ප්‍රවේශපත් අලෙවිකරු තනතුරේ නිලධාරීන් වෙනුවට කම්කරුවන් සේවයේ යොදවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී අවසන් කර තිබූ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත පවරන ලද පොළොන්නරුව ගල් විහාරයේ විද්‍යාධාර ලෙනට ඉහළින් පියස්සක් නිර්මාණය කිරීමේ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් ගෙවීම් කිරීමේදී 2012 වර්ෂයේ දී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ගෙවා තිබුණු රු. 1,427,866 ක් වූ සියයට 20 ක අත්තිකාරම් මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ගිවිසුම ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා කොන්ත්‍රාත්කරුවකුට එරෙහිව අරමුදල විසින් පවරා තිබූ නඩුවෙහි තීන්දුව ප්‍රකාරව රු. 4,472,150 ක මුදලක් අරමුදල වෙත ගෙවන ලෙස 2011 ජුනි 30 දින පෞද්ගලික සමාගමක් වෙත නියෝග කර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් එම මුදල් අයකරගෙන නොතිබුණි.

4.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා.**

මූල්‍ය ප්‍රකාශනවලට අනුව අනෙකුත් සංස්කෘතික ක්‍රියාකාරකම් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 115.67 ක් වැයකර තිබූ අතර එය ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී රු. මිලියන 53 ක් හෙවත් සියයට 85 කින් වැඩිවී තිබුණි. ලබාදෙන මුදල් ඒ සඳහාම යොදවන බවට සහ අදාල කාර්යයන් නිසි පරිදි ඉටුකර ඇති බවට තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයකින් තොරව පන්සල් නවීකරණය හා පෙරහැර සඳහා අනුග්‍රාහක ආධාර ලබාදීම ප්‍රධාන වශයෙන් සිදුකර තිබූ අතර ඒ සඳහා ප්‍රමුඛතා ලැයිස්තුවක්, නිර්ණායකයක්, සැලැස්මක් හෝ ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි.

4.4 **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සැලසුම් හා පිරිවිතර සකස් කිරීමකින් තොරව සීගිරිය ව්‍යාපෘතිය සඳහා අඩි 40 x 80 ප්‍රමාණයේ ජංගම ප්‍රදර්ශන කුටියක් ප්‍රසම්පාදන ක්‍රියාවලියට පටහැනිව රු. 3,176,708 ක් වැය කර මිලට ගෙන තිබූ අතර එය අරමුදලේ අවශ්‍යතා සඳහා උපයෝගී කර ගැනීමකින්

තොරව නිෂ්ක්‍රීයව පැවතුණි. එසේම සැපයුම්කරු වෙත නිල ඇණවුමක්ද නිකුත් කර නොතිබූ හෙයින් මෙම ගනුදෙනු විනිවිදභාවයෙන් සිදුවී නොතිබූ බව නිරීක්ෂණය විය. තවද මෙම කුටිය අවස්ථා 5 කදී දේශපාලන රැස්වීම් සඳහා ලබාදී තිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ආ) අරමුදලේ ප්‍රකාශන අංශය විසින් 2013 වර්ෂයේදී රු. 1,069,636 ක් වැයකර මුද්‍රණය කර තිබූ " මල්වතු මහාවිහාරවංශ මහානාහිමිවරු " ග්‍රන්ථය පිටපත් 998 කින් පිටපත් 901 ක් පරිත්‍යාග වශයෙන් ලබාදී තිබූ අතර එයින් රු. 953,884 ක් පිරිවැය වූ ග්‍රන්ථ 890 ක් සංස්කෘතික හා කලා කටයුතු විෂයභාර අමාත්‍යවරයා වෙත නිකුත් කර තිබුණි. මේ අනුව මෙම ග්‍රන්ථය අරමුදලේ අවශ්‍යතාවයක් මත මුද්‍රණය කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) ඉන්දියාවේ පැවැත්වූ සාර්ක් රටවල අමාත්‍යවරුන්ගේ සමුළුවක් සඳහා සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 24 දින සිට 27 දින දක්වා සහභාගීවී තිබුණු සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යවරයා ඇතුළු නිලධාරීන්ගේ ගුවන් ප්‍රවේශපත්, අනියම් වියදම්, සංග්‍රහ දීමනා ආදිය සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදලින් රු. 1,718,882 ක් වැය කර තිබුණි.

(ඈ) සීගිරිය ව්‍යාපෘතියේ ආපනශාලාව නවීකරණය කිරීම සඳහා ටෙම්පර්ඩ් යුගල දොරවල් සවිකිරීම වෙනුවෙන් රු. 1,790,000 කට කොන්ත්‍රාත්තුව පැවරීමේදී තරඟකාරී ලංසු කැඳවීමක් සිදුකර නොතිබූ අතර පිරිවිතර, නිර්මාණ සැලසුම් ආදී කිසිවක් අරමුදල විසින් ලබාදී නොතිබුණි. තවද තාක්ෂණික නිලධාරියෙකුගේ සහතිකයකින් තොරව කොන්ත්‍රාත්තුව සඳහා සම්පූර්ණ මුදල ගෙවා තිබුණි.

4.5 **දෘශ්‍ය අක්‍රමිකතා**

--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) " අපේ උරුමය" ශ්‍රව්‍ය දෘශ්‍ය වාර්තාමය වැඩසටහන නිෂ්පාදනය කිරීම.

--------------------------------------------------------------------------------

(i) මෙම වාර්තාමය වැඩසටහන නිෂ්පාදනය කර ගැනීම සඳහා විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් තොරව චිත්‍රපට අධ්‍යක්ෂවරයකු සමඟ මුළු වටිනාකම රු.18,725,700 ක් වන ගිවිසුම් තුනකට 2011 , 2012 හා 2014 වර්ෂවලදී එළඹී තිබුණි.

(ii) 2011 හා 2012 වර්ෂ වලදී එළඹී තිබූ මුළු වටිනාකම රු.7,237,000 ක් වූ පළමු හා දෙවන ගිවිසුම් අනුව ගිවිසුම් ගත කාලය තුල කාර්යය නිමකර භාර දී නොතිබියදී ගිවිසුමේ සඳහන් සම්පූර්ණ මුදල ගෙවා තිබූ අතර 2014 අගෝස්තු 19 දින රු.11,488,700 කට එළැඹි තෙවන ගිවිසුම අනුව නියමිත කාලය තුළ වැඩසටහන නිෂ්පාදනය කර භාරදී නොතිබියදී ගිවිසුම්ගත මුදලෙන් සියයට 40 ක් එනම් රු. 4,595,480 ක් ගෙවා තිබුණි. ගිවිසුමේ කොන්දේසි අනුව නියමිත කාලය තුළ වැඩ අවසන් කර භාර නොදෙන්නේ නම් ගිවිසුම අවලංගු කර මුදල් නොගෙවා සිටිය යුතු වුවද එසේ සිදුකර නොතිබුණු අතර ගිවිසුම් අනුව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) කහවිල්ගොඩ ජාතික උරුම සංකල්ප කෞතුකාගාරය ඉදිකිරීම

--------------------------------------------------------------------------

මෙම ඉදිකිරීම සඳහා ජාතික උරුම උයන භාරය නමින් වූ කිසිදු නීත්‍යානුකූල පදනමක් නැති ආයතනයකට වසර 3 ක් තුළ රු. මිලියන 60 ක මුදලක් ණය පදනම මත ලබාදීම සඳහා සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි 19 දින ගිවිසුමකට එළඹ තිබූ අතර 2015 ජනවාරි 30 වන විට රු. මිලියන 30.5 ක් ගෙවීම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල් පනතේ විධිවිධානවලට පටහැනිව හා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියෙන් තොරව බාහිර පාර්ශවයකට ණය ලබාදී තිබුණි.

(ii) ඉදිකිරීම්වල සැලැස්මක්, ඇස්තමේන්තුවක්, ප්‍රමාණ පත්‍රයක් හෝ ඉටුකරනු ලබන කාර්යභාරය, මුදල් වැය කරන ආකාරය පිළිබඳ විස්තරද, කළවැඩ වාර්තා, ඉංජිනේරු සහතික යනාදී කිසිදු සාක්ෂියක් නොමැතිව හා වැඩ අධීක්ෂණයකින් තොරව රු.මිලියන 30.5 ක මුදල මෙම භාරය වෙත ගෙවා තිබුණි.

(iii) මෙවැනි විශේෂිත ඉදිකිරීමක් සඳහා අවශ්‍ය රජයේ ආයතනවල අනුමැතීන් කිසිවක් ලබාගෙන නොතිබූ අතර ඉදිකිරීම් සිදු කරනු ලබන ඉඩමට අදාලව එහි හිමිකරු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් පවරා තිබියදී ඒ පිළිබඳවද නොසලකා මධ්‍යම සංස්කෘතික අරමුදලින් මුදල් නිදහස් කර තිබුණි.

(ඇ) විදේශීය සංචාරක ප්‍රවේශපත් සමග නොමිලේ ලබාදීම සඳහා DVD සපයා ගැනීම
-----------------------------------------------------------------------------------------

අවශ්‍යතාවය ඇගැයීමකින් තොරව හා විධිමත් ටෙන්ඩර් ක්‍රියා පටිපාටීන් අනුගමනය කිරීමකින් තොරව සීගිරිය, පොළොන්නරුව හා අනුරාධපුර යන සිද්ධස්ථාන ඇතුළත් DVD ලක්ෂ 5 ක් සපයා ගැනීම සඳහා ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂයේදී රු. 51,099,925 ක් චිත්‍රපට අධ්‍යක්ෂවරයකු වෙත ගෙවා තිබුණි.

කොන්ත්‍රාත්කරු විසින් අරමුදල සඳහා කලින් නිෂ්පාදනය කළ වැඩසටහනක රූපරාමු පරිගණකය මගින් පිටපත් කර අදාල DVD සපයා තිබියදීත් අරමුදලේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයා ඒ බව වසන් කර ගෙවීම් කිරීමට කටයුතු කිරීම නිසා රු. මිලියන 50 කට වැඩි මුදලක් වංචා කිරීමට කොන්ත්‍රාත්කරුට හැකිවී තිබුණි. මේ පිළිබඳ විධිමත් පරීක්ෂාවක් කරන ලෙස හා වංචාව පිළිබඳ පොලීසිය වෙත පැමිණිලි කරන ලෙස රාජ්‍ය ගිණුම් කාරක සභාව හා අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටුව අමාත්‍යාංශ ලේකම්වරයා වෙත නියෝග කළද ලේකම්වරයා ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**4.6 ඌන උපයෝජිත වත්කම්**
-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ 3 කට වැඩි කාලයක සිට අලහාන ව්‍යාපෘතියේ ගොඩගසා තිබෙන පැරණි උළු කැට 11,377 ක් වෙන්දේසි කිරීම හෝ අපහරණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) අරමුදල සතුව පවතින වාහන 16 ක් වසරකට වැඩි කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන ප්‍රධාන කාර්යාලයේ හා ව්‍යාපෘතිවල අබලි වශයෙන් අනාරක්ෂිතව නවතා තිබූ අතර එම වාහනවලින් 8 ක් සමාලෝචිත වර්ෂය සඳහා රක්ෂණය කිරීමටද කටයුතු කර තිබුණි.

**4.7 ආර්ථික නොවූ ගනුදෙනු**
-----------------------------

සීගිරිය ව්‍යාපෘතියේ පැරණි ආපනශාලාව රු. 6,599,746 ක් වැය කර සම්පූර්ණයෙන්ම නවීකරණය කර එය සමාලෝචිත වර්ෂය තුළදී පවත්වාගෙන යාම සඳහා කිසිදු බදු මුදලක් අය කිරීමකින් තොරව බාහිර පුද්ගලයෙකුට ලබාදී තිබුණද ව්‍යාපෘතියේ සේවක සුභසාධක සංගමය විසින් පැරණි ආපනශාලාව පවත්වාගෙන යාමේදී මාසිකව රු. 24,000 ක බදු කුලියක් අරමුදලට ගෙවා තිබුණි. තවද ආපනශාලාවේ 2014 වර්ෂයේ විදුලි බිලද ව්‍යාපෘතිය මගින්ම ගෙවා තිබූ අතර ජනවාරි සිට ජුලි දක්වා මාස 7 ක් සඳහා විදුලි බිල රු. 627,064 ක් වූයෙන් පෙර වර්ෂයට සාපේක්ෂව එය සියයට 123 කින් ඉහළ ගොස් තිබුණි.

4.8 **හඳුනාගන්නා ලද පාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රයෝජනයට ගත නොහැකි වාහන 17 ක් අලෙවි කිරීම සඳහා 2014 ජුලි 11 දින ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පලකර තිබූ අතර ඉල්ලුම්කරුවන් 49 දෙනෙකුගෙන් ලැබී තිබූ මිල ගණන් 2014 අගෝස්තු 06 දින විවෘත කර තිබුණි. වාහන 15 ක තක්සේරු වටිනාකම් වල එකතුව රු. 6,110,000 ක් වූ අතර එම වාහන 15 සඳහා ලැබී තිබූ වැඩිම ලංසු වටිනාකම් වල එකතුව රු. 11,147,999 ක් විය. එම ලංසුවට වාහන අලෙවිකර ගැනීමේ හැකියාව තිබියදී කිසිදු හේතුවක් නොමැතිව වාහන විකිණීම අත්හිටුවා තිබීම හේතුවෙන් අරමුදලට ලබා ගත හැකිව තිබූ රජ ඉවත් කිරීමේ ලාභයක් අහිමිව තිබුණි.

(ආ) අරමුදල විසින් පවත්වාගෙන යන අනුරූ පාසලේ අලෙවිය සඳහා නිෂ්පාදනය කරනු ලබන අනුරුවලින් සමාලෝචිත වර්ෂය තුළදී පිරිවැය රු. 4,278,305 ක් වූ අනුරූ අනුමැතියකින් තොරව බාහිර පාර්ශවයන් වෙත පරිත්‍යාග කර තිබුණි. එහි අලෙවි වටිනාකම රු. 9,271,550 ක් විය.

(ඇ) යාපහුව ව්‍යාපෘතිය වෙත දැව ලබා ගැනීමේදී රජයේ අනුමත ලියාපදිංචි දැව කම්හල් හිමියන්ගෙන් හෝ දැව නියෝජිතයන් වෙතින් මිලට ගැනීම වෙනුවට බලපත්‍ර රහිතව දැව රඳවාගෙන තබා ඇති අයගෙන් රු. 1,163,525 ක් වටිනා දැව සමාලෝචිත වර්ෂයේදී මිලට ගෙන තිබුණු අතර එම දැව නීතිවිරෝධී වීම නිසා අධිකරණය භාරයට ගෙන තිබුණි.

4.9 **අරමුණට පටහැනි ගෙවීම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හිටපු ජනාධිපතිවරයාගේ ජන්ම දිනය හා පදවි ප්‍රාප්ති වෙනුවෙන් හිටපු අමාත්‍යවරයාගේ පණිවුඩයක් පුවත්පතක පළ කිරීම හා සුභ පැතීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී අරමුදල විසින් රු. 1,986,200 ක් වැයකර තිබුණි. තවද හිටපු අමාත්‍යවරයා වෙත මල්වතු මහා විහාරයේ විංසද්වර්ගික කාරක සංඝ සභාව විසින් පිරිනමන ලද ගෞරව සම්මානයක් වෙනුවෙන් උපහාර දැක්වීමට පුවත්පත් දැන්වීමක් පලකිරීම සඳහා අරමුදල විසින් රු.413,000 ක් වැය කර තිබුණි.

(ආ) රාජකීය ආසියාතික සමිතිය නමින් වූ බාහිර පුද්ගලික ආයතනයක් විසින් සංවිධානය කළ ශාස්ත්‍රීය සම්මේලනය සඳහා අනුග්‍රාහක දීමනාවක් ලෙස අරමුදල විසින් රු.400,000 ක් ගෙවා තිබුණි.

(ඇ) අමාත්‍යවරයාගේ උපදෙස් මත ඔහුගේ මාධ්‍ය ලේකම් විසින් 2015 වර්ෂයේ අළුත් අවුරුදු සුභපැතුම් පත් 7,500 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් අරමුදල මගින් රු. 199,634 ක් දරා තිබුණි.

4.10 **වෙනත් රාජ්‍ය ආයතන හා වෙනත් බාහිර පාර්ශවයන් වෙත ලබාදුන් අරමුදලේ සම්පත්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සීගිරිය ව්‍යාපෘතියට අයත් රු. 1,614,965 ක් වටිනා යකඩ බට (GI බට) 474 ක් හා කප්ලීන් 677 ක් ඉදිකිරීම් කටයුතු සඳහා යොදා ගැනීමට බාහිර පාර්ශව වෙත ලබාදී තිබුණද ඒවා ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම භාණ්ඩ අරමුදලේ කටයුතුවලට යොදා නොගෙන වර්ෂ 1 ½ ක් පමණ කාලයක් බාහිර පුද්ගලයන් භාරයේ තබා තිබුණි.

(ආ) සීගිරිය ව්‍යාපෘතියට අයත් කැබ් රථයක් අමාත්‍යාංශයේ අවශ්‍යතා වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ මාර්තු 12 සිට අප්‍රේල් 21 දක්වා ලබාදී කි.මී.2065 ක් ධාවනයේ යොදවා තිබූ අතර

හිටපු අමාත්‍යවරයාගේ ප්‍රයෝජනය සඳහා 2012 ජුනි 12 දින කැබ් රථයක් රැගෙන ගොස් තිබුණද එය විගණිත දිනය වු 2015 ජුලි 15 තෙක් ආපසු භාරදී නොතිබුණි. මෙම වාහනය ආපසු ලබා ගැනීම සඳහා අරමුදල විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) මධ්‍යම සංස්කෘතික අරමුදලේ ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන් 4 දෙනෙකු සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ සේවය සඳහා වර්ෂ ගණනකට පෙර සිට මුදා හැර තිබු අතර සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ඔවුන්ගේ වැටුප් හා දීමනා වශයෙන් එකතුව රු. 1,590,744 ක් අරමුදල මගින් ගෙවා තිබුණි.

(ඇ) අභයගිරිය ව්‍යාපෘතිය සතු වටිනාකම රු. 11,520,000 ක් වු යකඩ බට (GI බට) 3204 ක් සහ බට අල්ලු 4320 ක් 2010 දෙසැම්බර් 31 දින සිට සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 10 දක්වා කාලය තුළ අවස්ථා 12 කදී ව්‍යාපෘතියෙන් බාහිර පුද්ගලයින්ට අවිධිමත් ආකාරයෙන් ලබාදී තිබු අතර 2015 ජුලි 15 දින තෙක් මෙම ද්‍රව්‍ය ආපසු ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

## 4.11 කාර්ය මණ්ඩල පරිපාලනය

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සීගිරි ව්‍යාපෘතියේ කම්කරු තනතුරේ සේවකයන් 45 දෙනෙකු වර්ෂ 3 කට වැඩි කාලයක සිට නිත්‍ය තනතුරේ රාජකාරිවලින් බැහැරව ව්‍යාපෘති කාර්යාලය තුළ හා මුර සේවයේ රාජකාරිවල යොදවා තැබීම නිසා කම්කරුවන්ගේ සේවය ලබා ගැනීම සඳහා කුලී පදනම මත සේවකයින් යොදවා ගැනීමට සිදුවී තිබුණි. අවශ්‍යතාවය පරිදි කම්කරු හා මුර සේවාවන්හි පුරප්පාඩු සපුරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සීගිරි ව්‍යාපෘතියේ ආරක්ෂක නියාමක නිලධාරීන් 10 දෙනෙකු සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මාසය තුළ අඛණ්ඩව පැය 36 ක් සේවයේ යොදවාගෙන තිබීමෙන් කම්කරු පනතේ විධිවිධාන නොසලකා කටයුතු කර තිබුණි.

(ඇ) බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධානවලට අනුව කැණීම් පරීක්ෂක I ශ්‍රේණියේ සිට ව්‍යාපෘති කළමනාකරු තනතුර සඳහා පුරප්පාඩු පිරවීම සම්මුඛ පරීක්ෂණ කැඳවා සිදුකළ යුතු වුවත් සම්මුඛ පරීක්ෂණයක් නොපවත්වා කැණීම් පරීක්ෂක I ශ්‍රේණියේ නිලධාරිනියකට ව්‍යාපෘති කළමනාකරු තනතුරේ පත්වීමක් ලබාදී වැටුප් වර්ධක 13 ක්ද ලබාදී තිබුණි. එම නිලධාරිනියට ව්‍යාපෘති කළමනාකරු තනතුරට උසස්වීමේ පත්වීම් පෙර දාතම්කර ලබා දීම සඳහා ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 1.10 වගන්තිය පරිදි ආයතන අධ්‍යක්ෂකගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ඈ) විධිමත් අනුමැතියකින් තොරව නව තනතුරු ඇතිකිරීම හා තනතුරුවල අනුමත සීමාව ඉක්මවා බඳවා ගැනීම් නොකරන ලෙස 2011 ජුලි 21 දිනැති අංක DMS/E1/54/9/241 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් උපදෙස් දී තිබියදී ඊට පටහැනිව කටයුතු කරමින් සමාලෝචිත වර්ෂයේදී සහකාර අධ්‍යක්ෂ තනතුරු හයක් හා ව්‍යාපෘති කළමනාකරු තනතුරු 03 ක් සඳහා අනුමත සංඛ්‍යාව ඉක්මවා පත්වීම් ලබාදී වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

# 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-------------------------------------------

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

---------------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ් 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ඡේදය ප්‍රකාරව

ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජුලි 02 දින ඉදිරිපත් කර තිබුණි.

5.2 **පාලක මණ්ඩල රැස්වීම් පැවැත්වීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව සෑම මාසයකම අරමුදලේ පාලක මණ්ඩල රැස්වීම් පැවැත්වීම සිදුකල යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා පාලක මණ්ඩල රැස්වීම් පවත්වා තිබුණේ 4 ක් පමණි. 2014 ජූනි 06 දිනෙන් පසු 2015 වර්ෂය අවසානය දක්වා පාලක මණ්ඩල රැස්වීම් පවත්වා නොතිබුණි.

5.3 **අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා වු අයවැයගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේදී සියයට 20 සිට සියයට 123 දක්වා විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

5.4 **නොවිසඳී ඇති විගණන ඡේද**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) (i) පොළොන්නරුව පූජා භූමියේ අභ්‍යන්තර ප්‍රවේශ මාර්ගය කි.මී. 1 ක් දුරට සිමෙන්ති බ්ලොක් ගල් අසුරා සංවර්ධනය කිරීමේ කාර්යය වෙනුවෙන් කොන්ත්‍රාත් සමාගමක් වෙත රු.28,255,312 ක් ගෙවා තිබූ අතර 2012 වර්ෂයේ විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දුන්, නිසි ප්‍රමිතියට නොමැති කොන්ක්‍රීට් ගල් ඉදිකිරීම් සඳහා යොදාගෙන ඒ වෙනුවෙන් රු. 22,099,917 ක් ගෙවා තිබීම, ප්‍රමාණපත්‍රය අනුව ඉටු නොකළ වැඩ වෙනුවෙන් රු. 4,660,998 ක් ගෙවීම සහ ABC ස්ථරය සියයට 40 ක් හා ගල්කුඩු මිශ්‍රණය සියයට 50ක් අඩුවෙන් යොදා තිබීම හේතුවෙන් මාර්ගය සමතුලිතතාවයෙන් තොරවීම යන අඩුපාඩු සම්බන්ධව 2015 ජුලි 30 දක්වාම කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ii) පොළොන්නරුව පූජා භූමියේ පිටවීමේ දොරටුවේ සිට අභ්‍යන්තරයට මාර්ගය කි.මී. 01 ක් සිමෙන්ති බ්ලොක් ගල් අතුරා වැඩි දියුණු කිරීමේ කාර්යය මාර්ග සංවර්ධන අධිකාරිය වෙත රු. 27,500,000 කට පවරා ඒ වෙනුවෙන් රු. 29,235,510 ක් ගෙවා තිබුණි. ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය හා තාක්ෂණ ඇගැයීම් කමිටුවේ නිර්දේශය ලබා නොගෙන, අනුමැතියෙන් තොරව පාරේ පළල වැඩි කිරීම හා ප්‍රමිතියෙන් තොරව කටයුතු කිරීම හේතුවෙන් ඇස්තමේන්තුගත මුදල රු. 48,575,893 ක් දක්වා ඉහළ යාම සහ නිසි ප්‍රමිතියට නොමැති සිමෙන්ති බ්ලොක් ගල් ඉදිකිරීම් සඳහා යොදාගෙන ඒ වෙනුවෙන් රු.16,992,545 ක් ගෙවා තිබීම පිළිබඳ 2013 විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දී තිබුණද ඊට අදාලව මෙතෙක් ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි.

(ආ) අරමුදලේ නීති නිලධාරී තනතුර සඳහා සුදුසුකම් නොමැති නිලධාරියෙකු කොන්ත්‍රාත් පදනම මත 2013 ජුනි 01 සිට බඳවා ගැනීමේදී පැවති අඩුපාඩු සම්බන්ධයෙන් 2013 විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දී තිබුණද තවදුරටත් එම නිලධාරියා අරමුදලේ සේවයේ යොදවාගෙන සමාලෝචිත වර්ෂය සඳහා වැටුප් හා දීමනා ලෙස රු. 478,620 ක් ගෙවා තිබුණි.

(ඇ) සී/ස සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් පෞද්ගලික සමාගමෙන් පුහුණු සංරක්ෂණ / කැණීම් සහායකයින් ලෙස ශ්‍රමිකයින් කොන්ත්‍රාත් පදනම මත ලබා ගැනීම සම්බන්ධයෙන් පැවති අඩුපාඩු 2013 විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දී තිබුණද සමාලෝචිත වර්ෂයේද එම සමාගමින් ශ්‍රමිකයින් ලබාගෙන ඔවුන් වෙනුවෙන් රු. මිලියන 142 ක දීමනා ගෙවා තිබුණි.

(ඈ) මධ්‍යම සංස්කෘතික අරමුදලේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවන හා මධ්‍යම සංස්කෘතික අරමුදල් පනතේ සඳහන් නොවන ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුරක් සඳහා 2006 ජනවාරි සිට 2013 දෙසැම්බර් දක්වා මාසික දීමනා ලෙස රු. 4,494,105 ක් ගෙවා තිබීම හා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියෙන් හා මධ්‍යම සංස්කෘතික අරමුදල මගින්ද සම්පූර්ණ වැටුප් ලබාගෙන තිබීම, එම ආයතන දෙකෙන්ම වෙන්කල වාහන දෙකක් භාවිතා කිරීම හා ඉන්ධන

දීමනා ලබාගෙන තිබීම පිළිබඳ 2013 වර්ෂයේ විගණකාධිපති වාර්තාවෙන් පෙන්වාදී තිබුණද ඒ පිළිබඳ කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබූ අතර 2014 වර්ෂයේ ජනවාරි සිට 2015 ජනවාරි තෙක් මාසික දීමනා ලෙස තවදුරටත් රු. 886,730 ක් ගෙවා තිබුණි.

6. **පද්ධති හා පාලනයන්**

**-------------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා පිළිබඳව වරින්වර අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කර ඇත. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි තවදුරටත් විශේෂ අවධානය යොමුකළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පාලනය
(ඇ) ප්‍රසම්පාදනය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ) වාහන උපයෝජනය
(ඊ) සේවක මණ්ඩල කළමනාකරණය
(උ) සංචාරක ප්‍රවේශපත්‍ර මුද්‍රණය , අලෙවිය හා තොග පාලනය සම්බන්ධ අභ්‍යන්තර පාලනය